# 16 අගනා දේව දයාද - දරුවෝ

**ශු. මතෙව් 17:14-18,   ශු. ලූක් 8:40-42 ,  49-56**

ජේසුස් වහන්සේ දරුවන්ට මහත් සේ කරුණාව දැක්වූ සේක. උන්වහන්සේ වෙත පැමිණි දරුවන් තුරුලට ගෙන ආදරය කළ සේක; පීඩා විඳින දරුවන් කෙරෙහි කරුණාව දැක්වූ සේක. දරුවන් අගය කළ සේක. ජේසුස් වහන්සේ දරුවන් කෙතරම් අගය කළේ ද යත්, දේව රාජ්‍යය උරුම කරගන්නට දරුවන් මෙන් වන්නැ” යි පැවසූ සේක. එලෙස ජේසුස් වහන්සේ දරුවන්ට වටිනාකමක් ලබා දී ඔවුන්ට ආදරය කරුණාව දක්වමින් ක්‍රියා කළ අවස්ථා දෙකක් පිළිබඳ ව විමසා බැලීමට යොමු වෙමු.

**විමසුමට**
**ශු. බයිබලයෙන්**
**ශු. මතෙව් 17:14-18**

සමිඳුන්ගේ පාමුල - දණින් වැටී මෙලෙසට
පිහිට පතයි සුවය පතා - මී මැස්මොර දරුවට

සමිඳුනි කරුණාකොට - සුවය දෙන්න පුතුහට
අයැද සිටියි පියා මෙලෙස - සමිඳුන්ගේ පාමුල

ගින්නෙහි හා වතුරෙහි - වැටෙනා කල දරුවව
තදබල ලෙස පීඩා විඳ - කරදර වෙයි මගේ පුතු

ශ්‍රාවකයන් වෙත මම - ගෙන ආ කල මගෙ පුතු
සුවය දෙන්න නුපුළුවනැයි - ඔවුන් කීවේ මා හට

ගෙනෙන්න ඔහු මා වෙත - පැවසූ සේක හිමිතුම
දුෂ්ට ආත්මය දුරුකොට - පියාට දෙයි සුවකොට

දුරුවී යයි රෝගය - සුවපත් වෙයි දරුවව
ජේසු සමිඳු කරුණාවෙන් - සුවය ලැබෙයි දරුවට

ඉහත විරිඳුවෙහි සඳහන් වූ ලෙස මීමැස්මොර රෝගී දරුවා පිළිබඳ ව පියා බොහෝ සිත් වේදනාවෙන් සිටියේ ය. එබැවින් ඔහු ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයින් හමු වී දරුවා පිළිබඳ ව පවසා සුවය අයැද සිටියත් සහනයක් ලද නොහැකි විය.

පසු ව පියා තම දරුවා රැගෙන ජේසුස් වහන්සේ වෙතට පැමිණ සුවය අයැද සිටි අතර උන්වහන්සේ පියාගේ ඉල්ලීමට සවන් දී දරුවාට ආදරය කොට සුවය ලබා දුන් සේක.

**පසක් කර ගනිමු...**

- ⋆ දුෂ්ටාත්මයක බලපෑම නිසා දරුවා මීමැස්මොර රෝගයෙන් තදබල ලෙස පීඩා විඳි බව,
- ⋆ පළමු ව ශ්‍රාවකයන් වෙත ද, අසාර්ථක වූ කල නැවත ජේසුස් වහන්සේ වෙත ද දරුවාගේ සුවය පතා පියා යොමු වූයේ ස්වාමීන් වහන්සේ කෙරෙහි පියා තුළ වූ බලවත් ඇදහිල්ල නිසා බව,
- ⋆ දරුවන් කෙරෙහි ජේසුස් වහන්සේ තුළ වූ බලවත් ආදරයත්, පියාගේ බලවත් ඇදහිල්ලත් තුළ, දුෂ්ටාත්මය දරුවාගෙන් පහකර සුවය ලබා දීමට ජේසුස් වහන්සේ කාරුණික වූ  බව,
- ⋆ දුෂ්ටාත්මවලට පවා අණකිරීමේ බලය ජේසුස් වහන්සේ සතු බව,
- ⋆ ස්වාමීන් වහන්සේ නොහඳුනන හෝ උන්වහන්සේ වෙතට ළඟාවිය නොහැකි ව සිටින හෝ රෝගීන් වැනි පීඩා විඳින්නන් වෙනුවෙන් ඇදහිලිවතුන් විසින් විශ්වාසයෙන් කරනු ලබන අයැදීම්වලට උන්වහන්සේ සවන් දෙන බව,
- ⋆ සැබෑ ඇදහිල්ල තුළ බොහෝ හාස්කම් කළ හැකි බව, ශ්‍රාවකයන්ට ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රකාශයෙන් සනාථවන බව,

ජේසුස් වහන්සේ එලෙස දරුවන් වෙනුවෙන් ආදරයෙන් ක්‍රියා කළ තවත් අවස්ථාවක් පිළිබඳ ව විමසා බලමු.

**විමසුමට**
**ශු. බයිබලයෙන්**
**ශු. ලූක් 8:40-42, 49-56**

යායිරස් නම් ප්‍රධානියෙක් - ජේසුතුමා වෙතට පැමිණ
එතුමගේ පා මුල වැටිලා - (අයැද සිටියි මේ විලසට) //

සිය නිවසට වඩිනා ලෙස - උදක් ම ඉල්ලා සිටිමින
එසේ කළේ තම දියණිය - (කරදරයෙන් බේරගන්න) //

මරණාසන්න ව සිටි තම - අවුරුදු දොළහක දියණිය
බේරා ගන්න ජේසුතුමා - (වෙත පැමිණියේ විශ්වාසෙට) //

නමුත් වූයේ නොසිතූ දෙයක් - පණිවුඩයක් ලැබුණා ඔහුට
දරුවා මියගොස් ඇති බව - (දැන ගන්නට ලැබුණා ඔහුට) //

එබස් ඇසූ යායිරස් හට - පැවසූවා ජේසුතුමා
ඇදහිල්ලෙන් ඔබ සිටින්න - (දරුවා සුවවේය කියා) //

සියල්ලෝ ම දරුවා ගැන - හඬා වැලපෙමින් සිටියා
ජේසුතුමා පැවසූයේ - (ඇය මැරිලා නැතැයි කියා) //

ඇය මැරිලා නොවේ නිදා - සිටියි කියා ජේසු කියයි
ඒ වදනට සියලු දෙනා - (අපහාසෙන් සිනා නගයි) //

ජේසුතුමා යෞවනියට - නැගිටින්නට තම අත දෙයි
ජීවිත අයිතිය ලැබුණා - (නැවතත් ඒ දියණිය වෙත) //

ජේසුතුමා මවුපියන්ට - පැවසූවා මේ විලසට
අද සිදු වූ දේ පිළිබඳ - (නොකියන්නට කිසිවකු හට) //

යායිරස් තම දියණිය පිළිබඳ ව ජේසුස් වහන්සේට සැලකළ විට උන්වහන්සේ ඇයගේ ගෙදරට වැඩම කළ සේක. දරුවාගේ මව ද පියා හා ශ්‍රාවකයන් ද සමග දරුවා සිටින ස්ථානය වෙත ගමන් කළ ජේසුස් වහන්සේ දියණිය වෙනුවෙන් ආදරයෙන් යුතු ව ක්‍රියා කරමින් ඇයට නැවත ජීවත් වීමේ අයිතිය ලබා දුන් සේක. දුව වෙනුවෙන් පියා කළ ඉල්ලීම ඉටු කළ සේක. සුවය ලද දියණිය තම පවුලට භාර දුන් සේක. දරුවාගේ ජීවිතය නැවත ලබා දීමෙන් එම පවුලේ දුක වේදනාව නිම කොට සතුට හා සැනසුම ලබා දුන් සේක.

**පසක් කර ගනිමු...**

- ★ මෙහි දී ද සිදුවනුයේ මරණාසන්න ව සිටි තම එක ම දියණියගේ සුවය (ජීවිතය) යදිමින් පියා විසින් ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් කෙරෙන ඉල්ලීමයි.
- ★ නමුත් එම බලාපොරොත්තුව සුන් කරමින්, ජේසුස් වහන්සේ දරුවා වෙතට පිවිසෙන්නට පෙර ඇය මළ බව දැනුම් දෙනු ලැබී ය.
- ★ **"බිය නොවන්න, ඇදහිල්ලෙන් ම සිටින්න, ඇය සුව වනු ඇත"** ජේසුස් වහන්සේගේ මෙම වදන් මත විශ්වාසය රඳවමින් සියල්ලෝ දරුවා වෙත ළඟා වූහ.
- ★ දරුවන් කෙරෙහි ජේසුස් වහන්සේ තුළ ඇති බලවත් ආදරයත්, පියාගේ ඇදහිල්ලත් තුළ දරුවාගෙන් ඉවත් වූ ප්‍රාණය උන්වහන්සේ නැවත ඇයට ලබා දුන් සේක.
- ★ අපගේ සියලුම බලාපොරොත්තු සුන් ව ගිය අවස්ථාවක දී වුව ද උන්වහන්සේ කෙරෙහි වන විශ්වාසය හා ඇදහිල්ල තුළ ජේසුස් වහන්සේට මහත් පුදුම දේ කළ හැකි වේ.

**සිතන්නට යමක්...**

ඉහතින් දක්වන ලද සිද්ධීන් දෙකෙහි දී ම, එම දරුවන්ට සුවය මෙන් ම නැවත ජීවිතය ද ලබා දෙන්නට ජේසුස් වහන්සේට අවස්ථා සැලසුණේ දරුවන්ගේ පියවරුන් උන්වහන්සේ කෙරෙහි තැබූ බලවත් විශ්වාසය හා ඇදහිල්ලයි. ජේසුස් වහන්සේ කෙරෙහි ඇදහිල්ලත් - විශ්වාසයත් පවත්වා ගැනීම තුළ උන්වහන්සේගේ නොමඳ ආදරය දරුවන් වන අප වෙත හිමි වන බව පැහැදිලි ය. අපගේ සියලු අවශ්‍යතා විශ්වාසයෙන් හා ඇදහිල්ලෙන් ජේසුස් වහන්සේ වෙත අපි ගෙන යමු. දරුවන්ට මහත් සේ ආදරය කරන ස්වාමීන් වහන්සේ අපට සහනය සලසන්නට මහත් ඕනෑකමින් බලා සිටින සේක.

**ක්‍රියාකාරකම**

1. ජේසුස් වහන්සේ දරුවන් අගය කරමින් කළ ප්‍රකාශ 2ක් ලියන්න.
2. දරුවන් වන ඔබ තුළ ඇති අනාගත බලාපොරොත්තු 2ක් දක්වා ඒවා ඉටු කර ගැනීමට ගතයුතු නිවැරැදි ක්‍රියාමාර්ග ලියන්න.